# 16 වැස්ස

## ගුණදාස අමරසේකර (1929)



වෘත්තියෙන් දන්ත වෛද්‍යවරයකු වන ගුණදාස අමරසේකර කවියකු ලෙස පමණක් නොව කෙටිකතාකරුවකු, නවකතාකරුවකු, සාහිත්‍ය හා සමාජ විචාරකයකු ලෙස ද ප්‍රකට ය. **භාව ගීත, උයනක හිඳ ලියූ කවි, ආවර්ජනා, අමල්බිසෝ, ගුරුළුවත හා අසක්දාකව** මොහු විසින් රචිත පද්‍ය ග්‍රන්ථ අතර වේ.

සාම්ප්‍රදායික කවි මග විවේචනය කරමින් බිහි වූ නිසඳැස් කවිය ද ඊට පූර්ව යුගයේ කවිය ද දැඩි විවේචනයට බඳුන් කළ මොහු, සම්ප්‍රදාය මත පිහිටමින් පැරණි කවියෙහි නොමඳ ආභාසයත් ජන කවියෙහි රිද්ම ලක්ෂණ හා නිර්ව්‍යාජත්වයත් හෘදයග්‍රාහී භාෂා හා අලංකාර භාවිතයත් ඇසුරින් සංකීර්ණ සමාජ හා මානව ධර්මතා විවරණය කරනු වස් කවිය මෙහෙයවිය යුතු බව දැඩි සේ පිළිගත් කවියෙකි. කවියෙහි භාෂාව, රිද්මය හා ආකෘතිය සම්ප්‍රදායෙන් උකහා ගත් සාරයෙන් පෝෂණය කිරීම මොහුගේ අනන්‍යතාව වේ. **'පස් මත් විරිත'** නූතන කවිය පවා ප්‍රවේශ වන්නේ අමරසේකරගේ භාවිතය ඔස්සේ ය.

අමරසේකර ස්වකීය නිර්මාණ පිළිබඳ වුවද ඉතා නම්‍යශීලී ආකල්පයක පසු වුණු කවියෙකි. පෘථුල ජීවන දෘෂ්ටියක් ප්‍රකාශ කළ හැකි මාධ්‍යයක් වන නිසඳැස් කවිය දේශීය රාමුවක් තුළ ස්ථාපනය කරමින් නූතන පද්‍ය කාව්‍ය ක්ෂේත්‍රයට මොහු දායාද කළ නව ප්‍රවණතා, වර්තමාන කවීන්ට අභිනව සම්ප්‍රදායන් පිළිබඳ අත් හදා බැලීම් සිදු කිරීමට ප්‍රබල දායකත්වයක් සැපයුවේ ය.

චිවිරි චිරි චිවිරි චිරි උදේ සිට ඇද හැලෙන
පොද නො කැඩී තෙත බරිව හිරිකිතෙන් කිලිපොලන
පාර තොට, ගහ කොල ද, වසාගෙන හැම අතින
වහින වැහි වහින වැහි නො පායන මුළු දවස

ගොහොරු මඩ ඇඟිලි කරු අතර චිරි චිරි ගාන
මඩ කඩිති හැම තැන ම මඩ පාට දිය රැඳුන
අළුත් පස් දැමූ පාර දනිහ තෙක් මඩ එරෙන
බැනියම ද ඇඟට ඇලි උදේ සිට තෙත බරිව

තෙමුන රෙදි ඇඟ ඇලුණ හබුරු කොල මලිපිටි ද
දෝර ගොස් හැම තැන ම වක්කලන් ඇලි හැදුන
හැට්ට අත් කඳ කලව තෙත රෙද්ද ඇඟ එතුව
වහින වැහි තද හුළඟ නො පායන මුළු දවස

ඔළුව කෙස් තෙත බරිව පිට දිගේ වැක්කෙරෙන
කාර් රෝදෙන් චිරිස් ඇඟ පුරා මඩ ඉහෙන
ආයිමත් හිටි ගමන් තද කරන් එන සැණින
වහින වැහි වහින වැහි නො පායන මුළු දවස

ගෙදර ගොස් ඇඳපු දේ මොහොතකින් ඉවර කොට
තුවායෙන් ඇඟ පත ද පිහ දමා හිස කෙස් ද
අළුත් සරමක් ඇඳන් උණට උණු තේ වතුර
ඇඳෙහි ඉඳ උණුහුමට බොන්නෙ කොයි මොහොතෙදැයි
වැහි පොදෙහි පෙඟුණ සිත හිත හිතා ලත වේ ය

## ලිඛිත අභ්‍යාස

1. ගුණදාස අමරසේකරයන්ගේ 'වැස්ස' පද්‍ය පන්තිය සරල අනුභූතියක් පාදක කර ගත්ත ද ගැඹුරු දෘෂ්ටියක් විවරණය කරන්නකි. මේ පිළිබඳ ඔබේ අදහස් විචාරාත්මකව දක්වන්න.
2. ගුණදාස අමරසේකරයන්ගේ ඉහත දැක්වුණු පද්‍ය පන්තිය සාර්ථක පද්‍ය පන්තියක් ලෙස අගය කළ හැකි ය. විමසන්න.
3. තේමාවට උචිත භාෂා භාවිතය මේ කවි පෙළේ විශේෂත්වයකි; නිදසුන් සහිත ව පහදන්න.